

# වසරේ හොඳම පොලීසිය අපේ පලාතෙන් ගොඩනගමු !

## පොලිසිය යහපත් ආයතනයක් බවට පත්කර ගැනීමේ වගකීම ඔබ සතුයි

නීති ගරුකව රාජකාරිය ඉටුකරන පොලිස් නිළධාරින් ධෛර්‍යයමත් කරමු

නීති කඩන පොලිස් නිලධාරීන්ට එරෙහිව යුක්තිය ඉල්ලා සිටීමට නීති ගරුක පුරවැසි ඔබට අයිතියක් තිබේ.

නීති විරෝධී ක්‍රියාවන්ට උඩ ගෙඩි නොදෙන්න
නීති විරෝධී ක්‍රියාවන් සිදුවන්නේ නම් නිහඬව කරබාගෙන නොසිට
ඊට එරෙහිව වහාම ක්‍රියාත්මක වන්න.

(නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම, පැය 24 කට වඩා රඳවා තබා ගැනීම, වධහිංසා පැමිණ වීම, ව්‍යාජ චෝදනා මත නඩු පැවරීම, අතුරුදහන් කරවීම, මරා දැමීම, පොලිසිය තුළ දී හෝ පිටත දී ශාරීරිකව හෝ මානසිකව අපහසුතාවයට අපකීර්තියට හා අවමානයට පත් කිරීම, රාජකාරිය ඉටුකිරීම පැහැර හැරීම නීති විරෝධී වේ)

**නීති විරෝධී ක්‍රියාවන්ට එරෙහිව**
**පැමිණිලි පහත සඳහන් ආයතනයන් වෙත ලිඛිත පැමිණිලි හෝ දිවුරුම් ප්‍රකාශ මගින් යොමු කරන්න.**

1 අදාල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට
2 පලාතේ පොලිස් අධිකාරී / සහකාර පොලිස් අධිකාරීවරයාට
3 පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01 දුරකතන/ ෆැක්ස් 011 2440440
4 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නො 36, කිංසි පාර, කොළඹ 08
දුරකතන 011 2694925, 2673806, 2685981, ෆැක්ස් 011 2694924
5 ජාතික පොලිස් කොමිෂන් සභාව, තුන්වන මහල, රොටුන්ඩා කුලුණ, නො 109, ගාලු පාර, කොළඹ 03
දුරකතන 011 2395310, ෆැක්ස් 011 2395867 ඊ මේල් polcom@sltnet.lk
6 නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12, ෆැක්ස් 0112436421
7 ජාතික ළමාරක්ෂක අධිකාරිය, අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, කෝට්ටේ
දුරකථන 011 2395310 ෆැක්ස් 011 2395867 (අවුරුදු 18 අඩු අය සම්බන්ධයෙන්)

PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

# ඔබ

## අහිංසකයෙක්.............
## සැකකරුවෙක් ................
## අපරාධකරුවෙක් ..................
## කවරෙකු වුවද ඔබේ අයිතිය

- අත්අඩංගුවට පත්වීමේ හේතුව දැන ගැනීමට
- අත්අඩංගුවට ගන්නා නිලධාරීන් කවුරුන්දැයි දැනගැනීමට
- ළඟම ඥාතීන් සමග කථාබහ කිරීමට
- නීතිඥ සහාය ලබා ගැනීමට
- කාන්තාවක් හෝ වයස අවුරුදු 18 ට අඩු නම් තම විශ්වාසවන්තයෙකුගේ සහාය ලබා ගැනීමට
- අත්අඩංගුවට පත්වූ වෙලාවේ පටන් පැය 24 ක් තුළ නිදහස්වීමට හෝ
  ඇප ලබා ගැනීමට හෝ මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් වීමට
- ප්‍රතිකාර ලබා ගැනීමට

**එසේම,**

**ශාරීරික හෝ මානසික වධහිංසාවන්ට ලක් නොවී සිටීමට ඔබට අයිතියක් තිබේ.**

**එමෙන්ම,**

**ඔබගේ ඉහත අයිතීන් උල්ලංඝනය වී ඇත්නම් ඒ බව මහේස්ත්‍රාත්තුමා හමුවන පළමු අවස්ථාවේදීම දන්වන්න.**


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 36, කිංසි පාර, කොළඹ 08
දුරකතන 011 2694925, 2673806, 2685981
ෆැක්ස් 011 2694924
ඊ මේල් schrc@sltnet.lk
හදිසි ඇමතුම් 011 2680964
පැය 24 පුරා විවෘතව ඇත


(ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කර ඇති දැන්වීමකින් උපුටා ගන්නා ලදී)

---

සියළු විමසීම්


**Right to Life මානව හිමිකම් මධ්‍යස්ථානය**
අංක 555, මීගමු පාර, කටුනායක දුරකතන/ෆැක්ස් 011 4879595, 2221604
ඊ මේල් right2life@sltnet.lk
web - http/www/right2lifelk.org



වත්තල කෙරඟපොකුණ පදිංචි M.M.W.R. කුමාර විසින් මීගමුව දෙහිමල් වත්තේ පිහිටි රත්වසි ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com